# පළමු ගුරුවරයා

එදා මං අයිලයට ආ පළවෙනි ම දවසෙ මං උඹගෙ දීප්තිමත් දෑස දුටුවා. මම අයිලයට එද්දි මගේ හදවතේ තිබුනෙ එක ම එක හැඟීමයි. ඒ මිනිස් සංහතියට ම ආදරේ කරන එක. මේ අයිලයේ ඉන්න පුංචි පුංචි උන්ට ජීවිතේ තියෙන්නෙ අයිලය ඇතුළෙ විතරක් නෙවෙයි එතනින් පිට බව කියාදෙන්නයි ඕන උනේ.

අන්න ඒ වගේ මොහොතක තමයි අල්තිනායි මට උඹගෙ දීප්තිමත් ඇස් දෙක එක්ක බැඳීමක් ඇතිවෙන්නෙ. සහතිකෙන් ම මට මුල් ම දවස්වල උඹ සම්බන්ධව තිබ්බෙ අනික් දැරියො ගැන තිබ්බ හැඟීමම තමයි. ඒත් කාලයත් එක්ක ඒ හැඟීම මුහුකුරා ගියා. මං උඹට ආදරේ නොකරා ය කීවොත්, ඒක මං කියන බොරුවක්. ඇත්ත, මං උඹ එක්ක පොප්ලර් ගස් දෙක හිටෙව්වෙත් ගෙදරට ම ගිහින් උඹව දුයිෂෙන් ඉස්කෝලෙට එක්ක ආවෙත් උඹට තිබ්බ ආදරේ හින්ද ම තමයි. උඹව අර රතු කෙසාගෙන් බේර ගත්තෙත් ආදරේ නිස. උඹ ඇහුව නේද ඒ ඔක්කම කරේ ආදරේ නිසා නෙවෙයි ද කියල. මට තියෙනව ඒකට උත්තරේ. මං ඒ හැමදේම කරේ උඹට තියෙන ආදරේ නිසා.




දැන් උඹ අහන අනික් ප්‍රශ්නෙටත් මං ඇත්ත ම උත්තරේ දෙන්නම්. අල්තිනායි, මං හෝඩියවත් හරියට බැරි හිටපු සොල්දාදුවෙක්. මං උඹට ආදරේ කීව නම්, අර ස්ටේෂමේදි මං අල්තිනායි කියල විතරක් නොකියා අල්තිනායි මං උඹට ආදරේය කීව නම් මං දන්නව සහසුද්දෙන් ම උඹ ඔය ගමන නගරෙට යන්නෑ. එහෙනම් උඹ කවම කවදාවත් මහාචාර්‍යතුමියක් වෙන් නෑ. උඹ මේ අයිලයේ ම නැවතිලා මගෙ ගෑණි වෙයි. ඊට පස්සෙන් පහු දරුවො වදයි. මං දන්න දේවල් ටික විතරක් උඹත් ඉගෙන ගනියි. අන්තිමට උඹගෙ ජීවිතේ ම මේ අයිලය විතරක් වෙයි. අන්න ඒ නිසා තමයි මං උඹට ආදරේ නොකීවෙ.

උඹට ජීවිතේ නොතේරුණ පාඩමක් තියෙනවා අල්තිනායි. ඒ ආදරේ කියන්නෙ වචනවලට විතරක් සීමා උන දෙයක් නෙවෙයි. ආදරේ පෙන්වන්නෙ ක්‍රියාවෙන්. බලපං අද උඹ පුංචි මහාචාර්‍යතුමියක් වෙලා. ඒක කොයිතරම් සතුටක් ද? දැන් උඹ ඉස්සර ම දවස්වල මේ අයිලය පුරා ගොම හොය හොයා ඇවිද්ද අර පුංචි කෙල්ල කියල කාටවත් මතක නෑ. ඉතින් ඒක ම මදිද මට සතුටුවෙන්න.

අල්තිනායි, උඹ මට දොස් කියපන්. ආදරේ ප්‍රකාශකරන්න බැරි නම් මොන කෙහෙල්මලකට ද මට එහෙම ළං වුනේ කියලා උඹ මට දොස් කියපං. ඒත් ඒ හැම වෙලාවක ම උඹ කන්නාඩියක් ඉස්සරාට ගිහිං බලපං. අන්න ඒ කණ්නාඩිය ඇතුළෙ මං ප්‍රකාශ නොකළ ඒත් මං මගේ අත්වලින් පරිස්සම් කරපු ආදරේ ඇති.

ඒ දිහා බලලා, මට දොස් කියනවද නැද්ද කියන එක තේරුම් ගනිං. කොහොම උනත් මං අදටත් මගේ පුංචි මහාචාර්‍යතුමියට ආදරෙයි.

මීට

දුයිෂෙන්

© ගයාන් අබේසිංහ
සංස්කාරක (wachana.lk)